රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 23/99

මගේ අංකය: ආ/1/13(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 ඔක්තෝබර් මස 29 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය නිලධරයන්ගේ විනය පාලනය**
**<u>ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(4) වැනි වගන්තිය මගින් පැවරී ඇති බලතල යටතේ, රාජ්‍ය නිලධරයන්ගේ විනය පාලනය පිළිබඳ බලතල ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය හා එකී බලතල පවරා දීමේ පටිපාටිය පිළිබඳව වන්නාවූ 1981.04.08 දිනැති ආයතන සංග්‍රහයේ II වෙනි කාණ්ඩයේ ඇතුලත් විධිවාධාන වෙනුවට, නව විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය මගින් පනවා ඇත.

02. මෙම විධිවිධානයන් අන්තර්ගත 1999.08.02 දිනැති ආයතන සංග්‍රහයේ නව II වෙනි කාණ්ඩය මේ වනවිට ප්‍රකාශයට පත් කොට තිබේ. මෙම නව විධිවිධානයන් 1999 නොවැම්බර් මස 01 වෙනි දින සිට බලපැවැත්වෙනු ඇත.

03. මෙතෙක් බලපැවැත්වූ ආයතන සංග්‍රහයේ II වෙනි කාණ්ඩය සහ එම කාණ්ඩය සංශෝධනය කරමින් නිකුත් කෙරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ද එකී විධිවිධානයන්ට අනුකූලව දැනටමත් ආරම්භ කොට ඇති විධිමත් විනය පරීක්ෂණවලට අගතියක් නොවන ආකාරයෙන් මෙතැන් සිට අවලංගු කෙරෙනු ඇති අතර ඒ වෙනුවට නව විධිවිධානයන් ආදේශ කෙරෙනු ඇත.

04. මෙම නව ආයතන සංග්‍රහයේ අර්ථකථනයක් සම්බන්ධව පැනනගින ගැටලු හෝ එමගින් ආවරණය නොවන අවස්ථා හෝ සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ විමසිය යුතුවේ.

05. ආයතන සංග්‍රහයේ නව II කාණ්ඩයේ මුද්‍රිත පිටපත් කොළඹ 01, ලෝටස් පාරේ අංක 32 දරණ තැන පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් ලබාගත හැකිය.

(මහින්ද බන්දුසේන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.